**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය - 2020**

**-----------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------------**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණු පිරිවැය රු.17,387,806 ක් වූ වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වී තිබුණු ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේදී මේ පිළිබඳව හඳුනාගෙන තිබූ නමුත් පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ එම කාර්යය සිදු කිරීමට නොහැකි වී ඇති අතර 2021 වර්ෂයේදී ඉවත් කල යුතු වත්කම් අපහරණය කිරීමටද භාවිතයට ගත හැකි අනිකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමටද අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් ඵලදායී ජීවිත කාලය තුල වාර්ෂිකව සමාලෝචනය කර ක්ෂය ප්‍රමාණය තීරණය කලයුතු බව |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂය සඳහා ලැබිය යුතු ආයෝජන පොළී ආදායම රු.832,890 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ අතිරික්තය හා ලැබිය යුතු පොළී ආදායම් එම ප්‍රමාණයෙන් | ගණනය කිරීමේදී සිදුවී ඇති මගහැරීම් පෙර වර්ෂයේ ගැලපුම් ලෙස 2021 වර්ෂයේ නිවැරදි කිරීමට ගණකාධිකාරීහට උපදෙස් ලබාදුනි. | එකඟ වූ පොළී අනුපාත හා නිවැරදි කාල පරිච්ඡේද සැලකිල්ලට ගෙන පොළී ගණනය කිරීම කල යුතුවීම. |

| | | |
|---|---|---|
| අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | | |
| (ආ) ආයතනය විසින් 2018 වර්ෂයේදී රු.9,700,000 කට වෑන් රථයක් මිලදීගෙන භාවිතා කර තිබූ නමුත් එය වාර්ෂිකව ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, රථ වාහනවලට අදාල ක්ෂය අනුපාතය, සටහන් මගින් හෙලිදරවු කර නොතිබුණු අතරම. වාහනයේ පිරිවැය ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛණයටද ඇතුළත් කර නොතිබුණි. | නිරීක්ෂණය සමහ එකහවන අතර 2020 වර්ෂයේදී එක්සෙල් පත්‍රිකා (excel sheet) මගින් ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීමේදී සිදු වූ දෝෂය ඉදිරියේදී නැවත ඇති නොවන බව තහවුරු කරමි.<br>වෑන් රථයේ 2020 වර්ෂයට අදාල ක්ෂය ගැලපීම ඉදිරියේදී පෙර වර්ෂ ගැලපීම යටතේ සටහන් කිරීමට උපදෙස් ලබාදී ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් මිලදී ගැනීම, ක්ෂය කිරීම, හෙලිදරවු කිරීම කලයුතු බව. |
| (ඇ) පරිත්‍යාගයක් මත මිලදී ගන්නා ලද රු.1,650,000 ක් වටිනා වෛද්‍ය උපකරණවලට අදාලව වාර්ෂික ක්ෂය රු.165,000 ක් වත්කම් ගිණුමෙන් අඩුකර තිබුණද එම ක්ෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට වියදමක් ලෙස ඇතුළත් කර නොතිබුණි. තවද, එම ක්ෂය වටිනාකමට සමාන ප්‍රමාණයකින් පරිත්‍යාගය, වාර්ෂික ක්‍රමක්ෂය කර, විලම්භිත අදායම් (Differed Revenue) ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | මෙම උපකරණ මිලදී ගන්නා අවස්ථාවේදී 2018 වර්ෂයේ ගිණුම් නැවත සංශෝධනය කර ඉදිරිපත් කෙරිණි.<br>ඔබ විසින් යෝජනා කර ඇති පරිදි ගිණුම් තැබීමේ නිවැරදිතාවය සනාථ කරමින් මෙම වත්කමෙහි ක්ෂය සම්බන්ධව ගිණුම් සටහන් තැබිය යුතු ආකාරය පිළිබඳ පැහැදිලි නිර්දේශයක් ලබාදෙන මෙන් ඉල්ලා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ගිණුම් තැබිය යුතු බව. |
| (ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී, 2020 වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.1,040,449 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ලැබීම් ලෙස දක්වා නොතිබීම, රු.11,583,055 ක් වූ ආයෝජන පොළී ආදායම සහ රු.60,104 ක් වූ සේවක ණය පොළී ආදායම සහ අදාල මුදල් ලැබීම් නිවැරදිව ගැලපීම් නොකිරීම, රු.51,000 ක් වූ භාණ්ඩ අපහරණ ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුලත් නොකිරීම හා රු.456,020 ක් පෙර වර්ෂයේ ගැලපුම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ඇතුලත් කිරීම යන කරුණු | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී නිසි අවධානය යොමුකරන ලෙස උපදෙස් ලබාදී ඇත.<br>රු.51,000 ක මුදල අබලි ද්‍රව්‍ය විකිණීමෙන් ලද ආදායමක් වන අතර ආයෝජනයක් නොවේ.<br>රු.456,020 ක් වූ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ පොළී ආදායම පෙර වර්ෂය හා සැසඳීමෙන් පෙර වර්ෂයට කලයුතු ගැලපුමක් සේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | | |
| (ඉ) | ආයතනය විසින් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ගිණුම් ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණු අතර මහා භාණ්ඩාගාරය මගින් ලබාදෙන ප්‍රාග්ධන ප්‍රදාන පලමුව භාණ්ඩාගාර ප්‍රදාන ලෙස ගිණුම්ගත කර පසුව ඉකුත් වර්ෂවලදී ලද ප්‍රදාන පමණක් පදනමකින් තොරව ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රතිපූරණ කිරීම් ලෙස සමුච්චිත අරමුදලට එකතු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම නිසා රජයේ ප්‍රාග්ධන ප්‍රදානවල සමස්ථ ප්‍රමාණය වෙනුවට අදාල වර්ෂයේ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන මුදල් පමණක් මූල්‍ය ප්‍රකාශවල පෙන්නුම් කෙරුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන ප්‍රමාණය රු.1,040,449 ක් පමණි. | ආයතනයේ සියළුම ගිණුම්කරන කටයුතු Quick Book පරිගණක මෘදුකාංගය තුළින් ගිණුම් සකසන අතර 2019 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් (වියදම් Excel Sheet) පත්‍රිකාවේ ඉදිරිපත් කරන මූල්‍ය වාර්තාවල වෙනමම සටහන් යටතේ ඉදිරිපත් කෙරුනත් එම ප්‍රාග්ධන ලැබීම් ගිණුම්කරණ පද්ධතිය මගින් සමුච්චිත අරමුදලට ස්වයංක්‍රීයව එකතු වන අතර එය ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී එම ගැලපුම් නැවත ඊළඟ වර්ෂයේ සටහන් අංක 4 යටතේ සමුච්චිත අතිරික්තය සෑදුනු ආකාරය සවිස්තරාත්මකව ඉදිරිපත් කරනු ලබයි. | ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ගිණුම් ප්‍රතිපත්තියක් සකස් කර මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කළ යුතු වීම හා ඒ අනුව ගිණුම් තැබිය යුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2009 අංක 38 දරන වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතන පනතේ 3 (1) (ග) උප වගන්තිය | වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රමිති පිහිටුවීමට ආයතනය කටයුතු කල යුතු වුවත් 2021 අප්‍රේල් 30 දින දක්වාම එම ප්‍රමිති පිහිටුවා නොතිබුණි. | කර්මාන්තශාලා අඥා පනතට අමතරව වෘත්තීය සුරක්ෂිතතා, සෞඛ්‍ය හා සුභසාධන පනත ලෙස නව පනතක් ගෙන ඒමට සියලු කටයුතු සූදානම් කර ඇත. එම නව පනත සම්මත වීමෙන් අනතරුව අදාල ප්‍රමිති පිහිටුවීමට කටයුතු කරනු ලැබේ. | 2009 අංක 38 දරන පනත අනුව කටයුතු කල යුතු බව. |
| (ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 : 2 වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික කාර්යසාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් මූල්‍ය ප්‍රකාශන | 16.2 වගන්තිය ප්‍රකාරව වෙනමම ආයතනයේ කාර්යසාධන වාර්තා ඉදිරි වර්ෂවලදී ගිණුම් ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට ක්‍රියාකරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

**1.7 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ආයතනයේ මෙහෙයුම් කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම සඳහා රඳවා තබාගත යුතු බැංකු ශේෂය හඳුනාගෙන අතිරික්ත මුදල් ඵලදායීව ආයෝජනය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සෑම මාසයක් අවසානයේදීම රු.මිලියන 4.6 සිට රු.මිලියන 19.3 ක් දක්වා ප්‍රමාණයන් ජංගම ගිණුමේ නිෂ්කාර්යව පැවතුණි. එම නිසා අරමුදලට උපයාගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි. | රු.මිලියන 5.9 ක ප්‍රමාණයක් සංචිතයක් ලෙස තබා ගැනීමට සිදුවූයේ 2020 වර්ෂයේදී වෛද්‍ය උපකරණ හා පරිගණක (Laptop) උපකරණ මිලදී ගැනීමට අපේක්ෂා කල බැවිනි. මේ වන විට පරිගණක (Laptop) මිලදීගෙන ඇතත් වරින්වර කොවිඩ් - 19 වසංගත තත්ත්වය මත එම උපකරණ ආනයනය කිරීම ප්‍රමාදවීම හේතුවෙන් ආයෝජනවල මුදල් තැන්පත් කිරීමට හැකියාවක් නොවූ අතර මෙම විගණන නිරීක්ෂණයෙහි සඳහන් ආකාරයට උපයාගත හැකිව තිබූ පොලී ආදායමක් අහිමි නොවූ හෙයින් එකඟවිය නොහැකි බව දන්වා සිටිමි. කෙසේ වුවද, ආයතනයේ ඇති මුදල් ශේෂය පිළිබඳ නිසි ඇගයීමකින් අනතුරුව විධිමත් පරිදි තක්සේරුවකින් අනතුරුව මුදල් ආයෝජනය කිරීමට කටයුතු කරන බව දන්වමි. | බැංකු ශේෂය හඳුනාගෙන අතිරික්ත මුදල් කෙටිකාලීන ඉතුරුම් ක්‍රමයක ආයෝජනය කිරීමට කටයුතු කල යුතු බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 11,057,350 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.28,130,642 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,073,292 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට කෝවිඩ් 19 වසංගතය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සියළු භාණ්ඩවල ලෙජරය අනුව ශේෂය පමණක් සඳහන් කර තිබූ අතර තථ්‍ය ශේෂය සඳහන් කර නොතිබුණි. මේ අනුව ඌනතා සහ අතිරික්තතා ගණනය කර නොතිබූ අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිවැරදිතාවය තහවුරුකර ගත නොහැකි විය | 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධයෙන් තත්‍ය ශේෂය සටහන් නොවීම සම්බන්ධයෙන් එකඟ වන අතර, කමිටු සාමාජිකයන් විසින් එම අත්සන්වලට පෙර (අවශ්‍ය පිටුවේ) අතිරික්තයක් හෝ ඌනතාවයක් නොමැති බවට සඳහන් කර ඇති බව ප්‍රකාශ කර සිටිමි. ඉදිරියේදී අදාල වාර්තාවන් ආයතනය වෙත යැවීමට ප්‍රථම නැවත පරීක්ෂා කරන ලෙස භාණ්ඩ සමීක්ෂණ කමිටු මෙන්ම අදාල වගකිව යුතු සියලු නිලධාරීන් හට උපදෙස් ලබාදුනි. | මු.රෙ.757 පරිදි 66 ආකෘතිය අනුව සමීක්ෂණ සිදු කිරීමට කටයුතු සිදුකල යුතු බව. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේ ආයතනයේ ලිපිද්‍රව්‍ය වියදම රු.427,308 ක් වී තිබුණි . 2020 වර්ෂයේදී එම වියදම රු.1,223,216 ක් වූ අතර 2020 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ ඉතිරි ලිපිද්‍රව්‍ය තොගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් 2019 වර්ෂයට සාපේක්ෂව අඩුවෙන් සිදුකර තිබූ නමුත් ලිපිද්‍රව්‍ය වියදම රු.795,908 කින් එනම් සියයට 186 කින් ඉහළ යාමට හේතුන් විගණනයට අනාවරණය නොවුණි. | 2019 වර්ෂයේ මුල තොග ලෙස පැවති රු.644,856 ක් වටිනා ලිපිද්‍රව්‍ය තොග 2020 වර්ෂය සඳහා ලබාගත් අතර 2020 වර්ෂයේ ලිපිද්‍රව්‍ය වියදම රු.578,359 ක් විය. 2020 වර්ෂයේ මිලදීගත් ලිපිද්‍රව්‍ය 2021 වර්ෂයේ දී මේ වන විටත් භාවිතා වන අතර 2021 වර්ෂය සඳහා දරා ඇති වියදම මේ වන විට රු.68,694 කි. උපලේඛන නිසි පරිදි පවත්වාගෙන යාමට උපදෙස් ලබාදෙන ලදී. | වර්ෂයට අදාල ආදායම නිවැරදිව පෙන්නුම් කරන ආකාරයට වර්ෂයට අදාල වියදම හා ඉතිරි තොගය ගණනය කල හැකි පරිදි ලිපිද්‍රව්‍ය තොග ලේඛන පවත්වාගත යුතු අතර ඉතිරි තොගයක් ඇත්නම් එය මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කල යුතුය. |